13

# හිම බිමේ සුදු රෝස

විද්‍යානි මනතුංග

## මෙතෙක් කතාව

උසස් අධ්‍යාපනය සඳහා පර්ත් පැමිණෙන ලහිරුට ටානයා මුණගැසේ. ඇය නිසා ජීවිතයේ මෙතෙක් අත්විඳ නොමැතිවූ චමත්කාරයක් ඔහු හෙළිදරව් කරගනියි. නමුත් ආදරය තමා අසලක වෙත්දී ඊට අසංවේදී වන ලහිරු උපාධි ප්‍රධානෝත්සවය දා රාත්‍රියේ තමාට අහිමිවී ගිය ආදරයක ඒ වේදනාකාරී සත්‍යය හෙළිදරව්කරගනී. ටානයාගේ ආදරය මහේලට හිමිවීමත් සමඟ මව්බිම කරා පෙරලා යන ලහිරු, තම හදවතේ ගැඹුරු මතකයක පමණක් ජීවත්වන රහසිගත ආදරයකට හිමිකම් කියමින් හුදකලා ජීවිතයකට මුලපුරයි. තවත් වසර කිහිපයකට පසු මහේල වෙනත් කෙනෙකු සමඟ හදිසියේම විවාහවූබව දැනගන්නා ලහිරු නැවතවරක් පර්ත් පැමිනෙන්නේ ටානයා වෙනුවෙන් වූ ප්‍රාර්ථනා ගොන්නක් පොදිබැඳගෙනය. එහෙත් පෙර බොහෝ අවස්ථා වලදී මෙන්ම මෙවරද බලාපොරොත්තු නොවන්නක්ම ශ්‍රවණයකරන ලහිරු එයින් බලවත්සේ කම්පනයට පත්වීම නිසා අනතුරකට මුහුණපායි.

අද එතැන් සිට....



"ලහිරු... ඔයාගෙ හිත කලබල කළා නම් අපිට සමාවෙන්න... නමුත් ටානයගේ ජීවිතේට හානියක් වෙලා නැහැ..." මට ඔවුන් ගැන ඇතිවන්නේ ද කෝපයකි. නිහඬවම කිවයුත්තක් කීමට ටානයාගේ මවට මම ඉඩදී සිටියෙමි.

"ටානය මේ දවස්වල රටින් පිටවෙලා ඉන්නෙ... නමුත් ලහිරු අපි තීරණය කළා ඔයා ගැන ටානයාට කියන්න ඕනැ කියල..."

"ඉතින්..." මා තුළ බලාපොරොත්තුවේ හැඟීමක්, ඈ දැකිය හැකි වෙතැයි සිතිවිල්ලක් මතුව එමින් තිබිණි.



"ටානයා ඉක්මනින් ම එයි ඔයාව බලන්න. ආවහම එයා ඔයාට කතා කරයි..." මම දෑස පියා ගතිමි. මගේ හිසේ දැනෙන වේදනාව සංසිඳී ගියාක් මෙන්යැයි මට දැනෙන්නට විය.

මට ඈ ඉක්මනින් ම දකින්නට ලැබිණි......!

සුදු රෝස මල් මිටියක් රැගෙන සුදු ගවුමකින් සැරසී ටානයා මා බැලීමට පැමිණියේ ගිනි මද්දහනක දී ය. ඇගේ ඒ විලාසය මරණය පිළිබඳව හැඟීමක් මා තුළ මතු කළ ද මම එවැනි කිසිවක් නොකියා නිහඬ වුණෙමි.

"ලහිරු ඔයාව මේ විදිහට දකින්න මම කොහෙත් ම බලපොරොත්තු වුණේ නැහැ..."

ඒ සුපුරුදු මිත්‍රත්වයේ දෑත පෙර පරිදිම නොවෙනස්ව මා වෙත දිගුවන බව ඇගේ පළමු දැකුමෙන්ම මම අවබෝධ කරගෙන සිටියෙමි..... මා සිටියේ විශේෂ අරමුණක් සහිතව සිතිවිලි දාමයක බැඳීමට නිස්කලංකයක් තිබිය නොහැකි තරම් වන වේගයකින් ඇදී ආ සිදුවීම් ජාලයකට මැදිවය. නමුත්, වෙන කිසිදවසක නොවන තරම් වූ බලාපොරොත්තුවේ හැඟීමක් ඒවනවිට මා වෙත ඉතිරිවී තිබිනි. ඒ බලාපොරොත්තුව ඇගේ සතුට වෙනුවෙන් හෝ මගේ සතුට වෙනුවෙන් හෝ අප දෙදෙනාගේම සතුට වෙනුවෙන් හෝ විය හැකිය. මගේ සතුට වෙනුවෙන් නම් ඇය මෙලෙස මා අසලක දැකීම පමණින්ම මුළු බලාපොරොත්තුවම ඉටුවී තිබිය යුතුය.

"ඊට ඉස්සෙල්ල කියන්න ඔයා කොහෙද ගිහින් හිටියෙ කියල ....?" රෝහලේ පොදු වායු සමීකරණ පද්ධතිය ඔස්සේ ගලා ආ සිසිලස ඒ දිනවල පරිසරයේ පැවති දැඩි රස්නය නිවාදැමීමට තරම් නොවන්නේ යැයි දැනී ගිය බැවින් මා සිටියේ වීදුරු ජනේලය අසල පුටුවකට බරදී පිටතවූ මද සුළඟත් සමඟ ඇදීආ සනීපයත්"ගිනිහමත් අතරමැද වූ සුවයක් විඳිමිනි.

"දැන් මම ආපහු ඇවිල්ලයි ඉන්නෙ ලහිරු... මම ඔයාගෙ අම්මට කතා කළා ආපු ගමන්..."

ටානයා දැකීමෙන් මම චකිතයකට හෝ නොසන්සුන්බවකට පත්වී නොසිටියෙමි. නමුත් වෙනදාට වඩා පහසුවකින් මා වෙත වචන ගලා එනබවක් මට දැනෙන්නට විය. ඒ නැතත් හදවතින් මම ඒ රුව දැක තිබෙන වාර ගණන දෙස බලන කල ජීවමාන රූපයට මාතුල වෙනසක් ඇතිකල නොහැකිවීම ගැන මා පුදුම නොවිය යුතුය.

"ඔයා මම ගැන කිව්ව ද අම්මට ටානයා...?"

"නෑ... ඔයා ගැන මුකුත් ම කතා කළේ නැහැ..." එය මට මහත් සැලසිල්ලකි. මා කතා කිරීමට උත්සාහ කළ ද ඊට වඩා තොරතුරු කිසිවක් ඈ කීවේ නැත.

"ලහිරු... හෙට ඔයාට ගෙදර යන්න පුළුවන් බව ඩොක්ටා කිව්ව. මම එනව මේ වෙලාවටම හෙට... ගෙදර ගිහින් අපි කතා කරමු..."

මා මෙහි පැමිණියේ ඈ වෙතට සැනසිල්ලක් වෙමැයි සිතාගෙනය. නමුත් දැන් එය නොපිටට සිදුවෙමින් පවතී. කෙසේ නමුත්, පසුගිය දින කිහිපයක් පුරාම ජීවිතය වෙලාගනිමින් පැවති කටුක බව අභිබවායමින් ප්‍රීතිමත් බලාපොරොත්තුවක යම්කිසි විස්තරකල නොහැකි සතුටක් මගේ හදවත තුල රෝපණයවී තිබේයැයි මට සිතිනි.

"ඔයා ඇයි ටානය සුදු රෝස මල් ගෙනාවෙ...?"

"ලහිරු මා වෙනුවෙන් දක්වන හිතවත්කම අගය කරන්න..." අනිත් ඕනෑ ම අවස්ථාවක දී මෙන් මේ අවස්ථාවේ දී ද මට ඇගේ මුහුණෝ මිත්‍රත්වයට වඩා වෙනස් හැඟීමක් කියවා ගත නොහැකි විය. මගේ මුළු ජීවිතාන්තය දක්වාම ඒ රුව මට මුණගැසීමට සිදුව ඇත්තේ මා වෙනුවෙන් වූ වෙනත් කිසිම හැඟීමකින් තොරව වුවද, අතපොවන මානයේ දුරකින් හෝ දකින ඒ දසුන තුලින් මා තුල ඇතිවන ප්‍රීතියේ මදකුත් වෙනස්කමක් කිසිදිනෙක ඇති නොවනු ඇත යැයි මම සිතමි..... පසුව දා ටානයාට කීකරුව ඇගේ රථය තෙක් රෝහලෙන් පිටවී මා ගියේ නිහඬව ම ය. රෝහලේ සියලු කටයුතු ටානයාගේ පියා ඊට කලින් පිළියෙල කර තිබීම මට මහත් අපහසුවක් වුව ද ඒ මොහොතේ මට කළ හැකි වෙනත් යමක් නොවූයෙන් මම නිහඬ වීමි. නමුත් වාහනය පණ ගැන්වීමට පෙර ඇයට මා කතා කෙරුවේ එය එසේ විය යුතුයැයි සිතා සිටි බැවිනි.

"ටානය... මට දැන් කෙලින් ම යන්න ඕනැ මම නැවතිල ඉන්න තැනටයි..." ඇය මොහෙතකට නිහඬ විය.

"ලහිරු... මට දක්වන හිතවත්කමක් හැටියට අපේ ගෙදර යමු ද?..."

"කොහෙත් ම බැහැ ටානයා... ඔයත් ඔයාගෙ පවුලෙ අයත් මට මේ දක්වල තියෙන හිතවත්කම දිහා බලනකොට මීට වඩා කරදර කරන්න කොහෙත් ම බැහැ..." මම ඊට තදින්ම විරෝධය දැක්වූයෙමි.

මොහොතක් නිහඬව ම වීදුරුවෙන් පිටත බලා සිටි ඈ කිසිවක් නොකියා වාහනය පණ ගැන්වූවා ය. නිහඬව ම වාහනය ඉදිරියට රැගෙන ගිය ටානයාගේ දෙනෙතින් කඳුළු කඩා හැලෙන්නට විය. ඈ හඬනවා කිසි දිනෙක මා දැක නොතිබිණි. එපමණක් නොව මා නිසා කිසි ම ගැහැනියක් හඬනවා ද මා මින් පෙර දැක නොතිබිණි. නමුත් මගේ චරිතය හිමි කරගෙන තිබූ සුපුරුදු දුර්වලතාවය නිසා ම ඈ සැනසීමට යමක් කියන්නට මට හැකියාවක් නොතිබිණි. මා කළේ ඇඬීම නවත්වන්න යැයි ඉල්ලා සිටීම පමණි.

"ටානයා.. අනේ කරුණාකරල අඬන් නැතුව ඉන්න..."

අප අතර නිහඬතාවය සෑහෙන වේලාවක් රකිමින් ටානයා වාහනය පැදවූවා ය. ඇගේ දෙනෙතේ වූ කඳුළු ඒ වන විට වියලී ගොස් තිබිණි. ඇය හැඬීම පිළිබඳව ලජ්ජාවූයේ වත්, ඊට හේතුවූ කාරණාව පිළිබඳව යමක් කියන්නට වත් නොගියේ ය. එය මට මහත් සැනසීමක් විය. ගැහැණියකගේ ලදබොළඳ මානසිකත්වය පිළිබඳව කොතරම් දුරට මම අනුකම්පා සහගත වුවද, හඬන ගැහැණියක් නැළවීම හෝ සැනසීම මට ඉතා අසීරු, හෝ ලැජ්ජා සහගත ක්‍රියාවකි. මම පියවර ඔසවා යන මේ ජීවිත ගමන් මඟ පුරා මට හමුවුන හෝ හමුවන, ඔවුන්ගේ දුක් සුසුම් වලකාලීම වෙනුවෙන් මට කලහැකි සියලු පරිත්‍යාගයන් කිරීම සඳහා කිසිම විටෙක මම පසුබට නොවන්නේද මේ නිසාමය... මම මේ පැමිණ සිටින්නේද එවැනි ගමනකි. මගේ සියලු සතුට හෝ ඇගේ සතුට වෙනුවෙන් කැප කිරීමට මම පසුබට නොවන්නෙමි. නමුත් බලාපොරොත්තු නොවන ලෙස මා වෙතට ටානයා විසින් විසිකර දමන ලද ඇගේ ඒ කඳුළු